# බුදුරජාණන් වහන්සේගේ අධ්‍යාපන ක්‍රමය

බුද්ධශ්‍රාවක ධර්මපීඨයේ ත්‍රිපිටකාංශයෙහි මහාචාර්ය පූජ්‍යපණ්ඩිතාචාර්ය හපුගොඩ නන්දරාම නායක ස්ථවිරපාදයන් වහන්සේ විසිනි.

අධ්‍යාපනය වූකලී සමස්ත මනුජ වර්ගයාගේ ඓහලෞකික – පාරලෞකිකාභිවෘද්ධියට අතිශයෝපකාරී වන විශිෂ්ටතම විද්‍යාවකි.

බුදුරජාණන් වහන්සේ ලොව පහළ වී වදාළේ සකල සත්වයා දුකින් මුදලීම සඳහා ය. එහෙයින් උන් වහන්සේ උගන්වා වදාළේ ඒ පරමාර්ථයට සර්වාකාරයෙන් ම ගැළපෙන පරමෝත්කෘෂ්ට ධර්ම ක්‍රමයෙකි.

උන් වහන්සේගේ ප්‍රධාන ඉගැන්වීම වූයේ චතුරාර්යසත්‍යය – පටිච්චසමුප්පාදය – ත්‍රිලක්ෂණය වැනි පරමගම්භීර ධර්මයන්ය. එයට එක ම හේතුව වූයේ දුක් අතුරෙන් අතිශයින්ම භයංකර වූ ඝෝර සංසාර දුඃඛයෙන් මිදෙන්නට පතන්නවුන් විසින් අනිවාර්යයෙන් ම උගත යුත්තේ ඒ ධර්මයන් වීමයි.

එහෙත් ලෝකයාට මෙලොව දුකින් හා පරලොව දුකින් ද මිදීමට අතිශයෝපකාරී වන කොතෙකුත් ඉගැන්වීම් ද උන් වහන්සේ නො අඩුව කළ සේක.

උන් වහන්සේගේ ඒ ඉගැන්වීම් පිළිබඳ සමාලෝචනයක් කිරීමට පෙර:-

- අධ්‍යයනය,
- අධ්‍යාපනය,
- අධ්‍යයනයේ හා අධ්‍යාපනයේ පරමාර්ථය,
- අධ්‍යාපන ක්‍රම,

යන මොවුන් පිළිබඳ විග්‍රහයක් කිරීම අතිශයින් ම යොග්‍යයයි සිතමි.

"අධ්‍යයන" යන මේ සංස්කෘත වචනය (තමන් ඉගෙන ගන්නා විෂයමාලාව) ගුරු මුඛයෙන් පිළිවෙළින් ශ්‍රවණය කිරීම, පාඩම් කිරීම යන අර්ථ ඇත්තේය. උද්ග්‍රහණ-උග්ගහණ-ඉගෙණීම-හැදෑරීම යන ශබ්දයන්ගෙන් ලැබෙන්නේ ද මේ අර්ථය මැයි.

ගුරු මුඛයෙන් ඇසීම, පත – පොත බැලීම, ලිවීම, ප්‍රශ්නෝත්තර කථනය, සාකච්ඡා පැවැත්වීම, ප්‍රායෝගික වශයෙන් පුහුණු වීම යනාදී විවිධ ක්‍රමවලින් දැනීම ලබා ගැනීමත්, එය වඩා වර්ධනය කර ගැනීමත් සඳහා ශිෂ්‍යයා විසින් කරනු ලබන මුළු ක්‍රියා පද්ධතිය ම "අධ්‍යයන" ශබ්දයෙන් වාච්‍ය වන්නේය.

"අධ්‍යාපන" යනු පූර්වෝක්ත අධ්‍යයන ශබ්දයාගේ ප්‍රයෝජ්‍ය කෘදන්තාවස්ථාවයි, ඉහත සඳහන් මුළු ක්‍රියාවලිය ශිෂ්‍යයන් ලවා කරවීම යනු එහි අදහස යි.

ගුරුවරයා උගන්වන විෂයමාලාව ශිෂ්‍යයාට පිළිවෙළින් අසන්නට සැලැස්වීම, පාඩම් කරවීම, පත-පොත බැලීමෙහි යෙදවීම, ලියවීම, ප්‍රශ්නෝත්තර සාකච්ඡාවන් කරවීම, ප්‍රායෝගික ක්‍රියාවන්හි යෙදවීම යනාදී විවිධ ක්‍රමවලින් දැනුම ලබාදීමටත්, එසේ ලබා දුන් දැනුම වඩා වර්ධනය කිරීමටත්, උගත් විෂයයන් නොමැලිව කය-වචන දෙකින්ම නිසි සේ ක්‍රියාත්මක කිරීමටත් ආචාර්යවරයන් විසින් ශිෂ්‍යයින් ලවා කරවන හැම ක්‍රියාවක් ම "අධ්‍යාපන" ශබ්දයෙන් කියවෙන්නේය. "ඉගැන්වීම, හැදෑරවීම" යන වචනවලින් කියවෙන්නේ ද එය මැයි.

ඉංග්‍රීසියෙහි එන "Education" යන්නට ඉංග්‍රීසි-සිංහල ශබ්දකෝෂවල අර්ථ දී තිබෙන්නේ 'අධ්‍යාපනය' කියාය. එහෙයින් යථෝක්ත අර්ථ විවරණය ඒ "Ebucation" ශබ්දයට ද සාධාරණ බව පෙනේ.

නූතන විචාරකයෝ "අධ්‍යාපන ශබ්දයේ පුළුල් අර්ථයක් ඇත්තේ ය"යි කියමින් අනේකවිධ විග්‍රහයන් ද ඉදිරිපත් කරති.

i. අධ්‍යාපනය[3] නම් ළමයින් ඇති දැඩි කිරීමය,

ii. අධ්‍යාපනය නම් ක්‍රමානුකූල උපදේශය,

iii. අධ්‍යාපනය නම් ඉගැන්වීම සඳහා පිළියෙළ කොට ඇති (කලා-ශාස්ත්‍රීය හෝ වාණිජ පාඨමාලා.

iv. අධ්‍යාපනය නම් චරිතයේ නොහොත් මනසේ ශක්තීන් සංවර්ධනය කිරීමයි,

v. අධ්‍යාපනය නම් ළමයකු වශයෙන් හැදීම, වැඩීම, නැතහොත් පුහුණු කිරීමයි.

vi අධ්‍යාපනය නම් සංස්කෘතියයි.

i අධ්‍යාපනය යනු ජීවත්වීමේ ක්‍රියාවලියක් මිස අනාගත ජීවිතය සඳහා සූදනම් වීමක් නොවේ.[4]

ii. අධ්‍යාපනය යනු ජීවිතය සඳහා සූදනම් කිරීමකි.[5]

iii. අධ්‍යාපනය යනු සමාජය හා සම්පූර්ණයෙන් සම්බන්ධ ක්‍රියාවලියකි.[6]

iv. අධ්‍යාපනය යනු ජීවිතය සඳහා, ජීවිතය තුළින් ජීවිතාන්තය දක්වා දිවෙන්නක් විය[7] යුතුය.

v. අධ්‍යාපනය නම් මිනිස් සම්පත් සංවර්ධනය සඳහා කරනු ලබන ආයෝජනයකි[8] යනු ඉන් සමහරෙකි.

මේ විග්‍රහයන් අනුව අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීමෙන් නූතන සමාජයට එක්තරා ප්‍රමාණයක සෙතක් සැලසී තිබේ.

ඉහත දක්වන ලද බොහෝ විග්‍රහයෝ මේ නිබන්ධයෙහි මුල සඳහන් විග්‍රහයට (අර්ථ වශයෙන්) ඇතුළත් වන්නාහ. සමහර විග්‍රහ කර තිබෙන්නේ නම් අඳුරෙහි ගමන් ගන්නාක් මෙනි, අවිනිශ්චිතවය සැකයෙන් වෙළී වෙළීය.

තවත් කිය යුත්තක් නම්: මේ සියලුම විග්‍රහකරුවනට අරමුණු වී තිබෙන්නේ: ළමයිනුත්, මෙලොව ජීවිතයත් පමණක් බවයි. ඒත් මිනිසාගේ පමණෙකි.

**අධ්‍යයනයේ හා අධ්‍යාපනයේ පරමාර්ථය**

නූතන වූ බොහෝ අධ්‍යාපන විශෙෂඥයින්ගේ ඇතැම් විග්‍රහ සමාලෝචනය කිරීමේ දී පෙනී යන්නේ ආර්ථික දියුණුව හා තම තමන්ගේ ජාතික සම්ප්‍රදයන් රැක ගැනීම පමණක් අධ්‍යාපන පරමාර්ථය ලෙස ඔවුන් සලකන බවයි. ඒ ඒ බලවතුන්ගේ දේශපාලන දර්ශනයන්ට අනුව මුළු රාජ්‍යය හැඩගැස්වීම අධ්‍යාපන පරමාර්ථයක් ලෙස දැන් දැන් සලකන බවක් ද පෙනේ.

අධ්‍යයනය හා අධ්‍යාපනය පිළිබඳ බුදුරජාණන් වහන්සේගේ පරමාර්ථය: "භුවනත්‍රයවාසී සකල සත්ව සමූහයා දුකින් මිදවීමයි" උන් වහන්සේ "දුක" කියා ප්‍රධාන වශයෙන් ඉගැන් වූයේ පඤ්චස්කන්ධ දුකය.

එය ම, 1. මෙලොව දුක,
2. පරලොව දුක,
3. සසර දුක, කියා තෙවැදෑරුම්

කොට ද දැක්විය හැකිය.

1. මේ භවයෙහි දී අත පය ආදී අඟපසඟ දිරා අවසඟ වීම, ඇස් නොපෙනීම හා කන් නො ඇසීමාදිය නිසා හටගන්නා දුක් ද, උණසන්නිපාත, ලේ අතිසාරාදී රෝග නිසා හටගන්නා දුක් ද, අත-පය කැඩීම්, කොන්ද බිඳීම් ආදී විවිධ උපද්‍රවයන් නිසා හටගන්නා දුක් ද, ආහාර හිඟය, රැකියා හිඟය, ආර්ථික පීඩාව, හොර-හතුරු බිය ආදී අනේක හේතූන්ගෙන් ඇති වන දුක් රැස ද මෙලොව දුක් නම් වේ.

මෙකී දුක් දුරු කර ගැනීම සඳහා ආර්ථික, අධ්‍යාපනික, සෞඛ්‍ය, සදාචාර යන චතුර්විධ තත්ත්වයෙන් ම මිනිසා දියුණු විය යුතු බව බුදුරජාණන් වහන්සේ ඉතා හොඳින් උගන්වා තිබේ.

ආර්ථික තත්ත්වයෙන් දියුණු වන්නට නම්: තමන් කරන කවර රැකියාවක් ගැන වුවත් හොඳ පුහුණුවක් ඇතිව නොමැලිව, හොර-බොරු නොකොට දක්ෂව ක්‍රියා කළ යුතු බව හා ක්‍රමානුකූලව පාලනය කර ගත යුතු බවත්, ධනය විනාශ කිරීමට මඟ පාදන පහත් ගති ඇති යහළුවන් දුරින් දුරු කළ යුතු බවත්, ස්වකීය ආදායමේ පමණට වියදම් කරමින් ජීවත් විය යුතු බවත් බුදුරජාණන් වහන්සේ මැනවින් උගන්වා තිබේ.[9]

අධ්‍යාපනිකාදී අන්‍ය තත්ත්වයන්ගෙන් දියුණු වීමට අත්‍යන්තෝපකාරී ඉගැන්වීම් ක්‍රම ද ත්‍රිපිටකය තුළින් උපුටා කොපමණ-වත් දැක්විය හැකිය. එය එසේ වුවත් මේ නිබන්ධය දීර්ඝ වන හෙයින් ඒ සියල්ල දැක්වීමට නොවෙහෙසෙමු.

කොතරම් අසරණ දුගී මිනිසකු වුවත් හේතු සම්පත් ඇත හෝ ඉහත සඳහන් කළ සියලු ඉගැන්වීම්වලට අනුව ක්‍රියා කළොත් ධනයෙන්, බලයෙන්, නිලයෙන්, ගුණ නුවණින් හා උගත්කමින් යුත් පුද්ගලයකු බවට පත්වනු පමණක් නොව ආරෝහ-පරිණාහ ලක්ෂණයෙන් යුත් නිරෝග වූ කායසම්පත්තියක් ඇත්තකු බවටත්, ජගත් කීර්තියකින් යුත් ආදර්ශවත් ශාන්තුවරයකු වැනි ශ්‍රේෂ්ඨ චරිත සම්පත්තියකින් හෙබි උත්තමයකු බවටත් පත් වන්නේමය. එවිට ඒ පින්වතා කෙරෙන් මෙලොව දුක් දුරු වන්නේ ය.

පරලොව දුක් නම්: මතු භවයන් අතුරෙන් අවීචි ආදී අට මහ නරකවල ද, තිරිසන්, ප්‍රේත, අසුර නිකායාදීන්හි ද ඉපිද විඳින දුක් හා මිනිස් ලොව අන්ධ-බධිරාදී වූ හෝ, රෝගාතුර වූ හෝ, දුගී-දුප්පත්-අසරණ වූ හෝ කෙනෙකුන් ව ඉපිද විඳින කටුක දුක් රස ය.

ඒ දුක්වලින් මිදීමට උපකාර වන්නේත් අතිශයින්ම පිරිසිදු වූ, සර්වාංග සම්පූර්ණ සදාචාර සම්පත්තිය මැයි. එකී සදාචාර සම්පත්තියෙන් මැනැවින් දියුණු වීමට අතිශයින් උපකාර වන පරමෝත්කෘෂ්ට ඉගැන්වීම් රැසක් අපේ බුදුරජාණන් වහන් සේ උගන්වා තිබේ.

සසර දුක් නම්: පඤ්චෝපාදානස්කන්ධ දුඃඛය මැයි. බුදුරජාණන් වහන්සේගේ අධ්‍යාපන ක්‍රමයේ උසස් ම අංගය වනුයේ මේ ස්කන්ධ දුඃඛයෙන් මිදීමට කරන ලද ඉගැන්වීම මැයි. මුළු අභිධර්මපිටකයත් සූත්‍රපිටකයේ විශාල කොටසකුත් වෙන් වී තිබෙන්නේ ඒ ඉගැන්වීම සඳහා ම ය.

විනයපිටකයෙන් කෙරෙන්නේ පූර්-වෝක්ත ඉගැන්වීම් ක්‍රියාත්මක කිරීමට හා කරවීමටත්, යොග්‍ය ක්‍රම සම්පාදනය හා ඊට ම යෝග්‍ය පුද්ගලයින් හෝ ගුරු වරුන් තැනීමත් ය.

මෙසෙයින් නො එක් ක්‍රමයට බෙද දැක්විය හැකි සියලු ම දුක්වලින් මිදෙන් නට නම්; යට සඳහන් වූ ආර්ථිකාදී හැම අංශයකින් ම උසස් අන්දමින් මිනිසා දියුණු විය යුතු යි.

එසේ නැති ව කෙබඳු ක්‍රමයේ දරුණු අපරාධයක් කොට නමුත් ආර්ථික අංශ-යෙන් පමණක් දියුණුවන ලෙස මිනිසා පෙළඹවීමෙන් සිදු වන්නේ දෙපා තිරි-සනුන්ගෙන් මහපොළොව පිරියාම යි.

අධ්‍යාපනක්‍රම:

පූර්වෝක්ත පරිහානිය වළක්වා මිනි සාට සර්වාකාර පරිපූර්ණ දියුණුවක් ලබා දෙන්නට නම් කළ යුත්තේ ඉහත සඳහන් චතුර්විධවිෂයයන්ට ම මුල් තැන ලැබෙන ලෙසින් අධ්‍යාපන ක්‍රමය සකස් කිරීම යි. බුදුරජාණන් වහන්සේගේ අධ්‍යාපනක්‍රමය සැකැසී තිබෙන්නේ එලෙසින් මැ යි.

එහි:
- පාඨශාලීය ක්‍රමයක් කැලැම නැත
- ළමයින්ට හෝ මිනිසුන්ට පමණක් සීමා වූවකුත් නොවේ.
- කාලසටහනක් තිබේ. එහෙත් එය ශ්‍රාවකයන්ට (ශිෂ්‍යයින්ට) නොව උන්වහන්සේටය.

එහි:

i. මහාකාලපරිච්ඡේද (පීරියඩ්) පසෙකි.
ii කුඩා කාලපරිච්ඡේද අටළොසක් පමණය.
iii. ඉන් ශරීරකෘත්‍යයටත්, පිඩු පිණිස හැසිරීමටත්, වැළඳීමටත් නිරෝධ සමාපත්තියට සම වැදීමටත් ගතවන කාලපරිච්ඡේද හැර ඉතිරි සියලු ම කාලපරිච්ඡේද ගෙවී යන්නේ ශ්‍රාවකයන් (ශිෂ්‍යයන්) උදෙසාමය.
iv. උන්වහන්සේ නිද්‍රෝපගතවූයේ (ලංසි) පැය එකකුත් විනාඩි විස්සක් පමණ වූ ඉතා කෙටි කාලයක් තුළපමණි.
v. පන්සාළිස් වසක් මුළුල්ලෙහි ම යථෝක්ත කාලසටහනට[10] අනුව වෛනෙය්‍යජනයාට (ශිෂ්‍යයින්ට) සියලු දුකින් මිදෙන ක්‍රමය ඉගැන්නූ සේක.

- උන්වහන්සේගේ අධ්‍යාපනක්‍රමයෙහි අර්ථාවබෝධක උපායයෝ ද අනන්තයහ:-

i. දන්නාදෙයින් නොදන්නා දෙයට යාමේ ක්‍රමය[11]
ii. සාකච්ඡාමාර්ගයෙන් කරුණු ඉගැන්වීම[12]
iii. නිදසුනෙන් කරුණු ඉගැන්වීම[13]
iv. උපමාවෙන් ,, ,, [13]
v. අනුක්‍රියාවෙන් ,, ,, [15]
vi. අනුකූලවීමෙන් ,, ,, [18]
vii. ප්‍රදර්ශනක්‍රමයෙන් ,, [17]
viii. ප්‍රශ්නෝත්තර ,, [18]
ix. දේශනා මාර්ගයෙන් කරුණු ඉගැන්වීම[19] යයි මෙසේ කරණප්‍රකාර වශයෙන් ද,

- සාමුහික[20]
- පෞද්ගලික වශයෙන් ද[21]
- ඒ ඒ පුද්ගලයාගේ චරිත -අජ්ඣාසය - අධිමුත්ති ආදී, මානසික තත්ත්වය බලා ඉගැන්වීම[22] යනාදී දේශනා විලාස වශයෙන් ද
- ඇසීමට (හෝ කියවීමට) සැලැස්වීම,
- එසේ උගන්වන ලද සූත්‍රය හෝ පිටකය හෝ නිකායාදීන් අතුරෙන් එකක් හෝ මුළු ත්‍රිපිටකය ම හෝ මැනවින් ධාරණය කර ගැනීමට උපයෝගී වන උපාය මාර්ගයන් යෙදීම,
- එසේ ධාරණය කරගන්නා සූත්‍රාදිය දශවිධ ව්‍යඤ්ජන සම්පත්තියෙන් යුක්තව මැනැවින් උච්චාරණය කරන්නට පුහුණු කිරීම,
- එලෙසින් උගත් විෂය මුළුල්ලෙහි (කිසිම තැනක නොහැපී) හිත ගමන් කරවන්නට පුහුණු කිරීම.
- ඉන් පසු ඒ උගත් විෂය අර්ථවශයෙන් ධර්මවශයෙන්, ව්‍යඤ්ජන වශයෙන්, පුබ්බාපරාදී විවිධක්‍රම වශයෙන් නුවණින් සලකා බලන්නට සැලැස්වීම යයි මෙසේ ඉදිරිපත් කිරීම, තහවුරු කිරීමාදී ක්‍රම වශයෙන් ද[23]
- උද්දේශ – ඉතා ලුහුඩින් මාතෘකාව ඉදිරිපත් කිරීම
- නිද්දේස - කෙටි විස්තරයකින් මාතෘකාවේ අදහස එළිදරව් කරදීම.
- පටිනිද්දේස - සම්පූර්ණ විස්තරයක් දීම යයි ඉදිරිපත් කරන ආකාර වශයන් ද[24]
- ආචික්ඛනා - නම් වශයෙන් වෙන් කොට දක්වමින් කරුණු ඉදිරිපත් කිරීම,
- දේසනා - දැක්වීම හෙවත් ඉදිරිපත් කරනලද විෂය පිළිබඳ ඉතා ලුහුඩු එහෙත් පැහැදිලි විස්තරයක් දීම
- පඤ්ඤපනා - ඥාණමුඛයෙහි තැබීම හෙවත් මනෝවිද්‍යානුකූලව ශිෂ්‍යයාගේ බුද්ධිප්‍රමාණය හා බුද්ධිස්වභාවය මැනගෙන ඔහුගේ බුද්ධියට ගෝචර වන පරිදි අර්ථය එළිදරව් කර දීම.
- පට්ඨපනා - පඤ්ඤාපනයෙන් පැහැදිලි වූ ප්‍රමාණයටත් වඩා බලවත් ලෙස ම අර්ථය පැහැදිලි කර දී, එළිදරව් කරදී තහවුරු කිරීම.

- විවරණා (ගුරුමුෂ්ටි ආදී කිසිවකින් නොවසා ධර්මාර්ථය මතු කොට විවෘතකොට දක්වීම)
- විභජනා (ධර්මාර්ථය කොටස් වශයෙන් බෙද බෙද ඉගැන්වීම.)
- උත්තානීකම්ම (විෂය පිළිබඳ අදහස නොගැඹුරු කිරීම; (ළිංපතුලක ගැඹුරෙහි තිබෙන කිසියම් රත්නයක් ගොඩට ගෙන පෙන්වන්නාක් මෙන් ඉගැන්නූ විෂය පිළිබඳ අර්ථය සම්පූර්ණයෙන් ම මතු කොට දක්වීම) යයි මෙසේ ඉදිරිපත් කිරීම අර්ථය එළිදරව් කිරීමාදිවශයෙන් පැවැති තවත් ක්‍රමයකින් ද[25]
- වාචෝද්ගත (කටපාඩම්) කිරීම.
- පිරිවැඹීම (කටපාඩම්කිම,)
- පදර්ථ කථනය,
- විවරණ සැපයීම,
- නිරුක්ති දක්වීම,

යනාදි වූ ශිෂ්‍යයා වැඩෙහි යොදවන ආකාර වශයෙන් දුයි මෙසේ උන් වහන්සේගේ අධ්‍යාපනක්‍රමය විවිධ අඞ්ගවලින් යුත් ඉතා පළල් - ගැඹුරු - යළිත් සරල වූ අර්ථාන්විත වූවකි.

මේහි සඳහන් කටපාඩම් ක්‍රමය යල් පැනගිය අර්ථශූන්‍ය ක්‍රමයකැයි ඇතැම් නූතනයෝ සලකති. මේ නිබන්ධයෙහි පෙර විස්තර කරනලද "සුතා - ධතා - වචසාපරිචිතා - මනසානුපෙක්ඛිතා - දිට්ඨියා සුප්පටිවිද්ධා" යයි දක්වුණු අධ්‍යාපනක්‍රමයට අනුව උගත් පුද්ගලයින්ට පූර්ණ පාණ්ඩිත්‍යයක් ලැබෙන්නේ ය. එහෙයින් කවරකු කවර විෂයයක් උගණිතත් එයට අවශ්‍ය හැම අඞ්ගයකින් යුක්තව ම උගත යුතුයි.

මෙසෙයින් දක්වනලද ඒ අධ්‍යාපන ක්‍රමය ළමයින්ට පමණක් හෝ, මෙලොවට පමණක් හෝ මිනිසුන්ට පමණක් හෝ සීමා වූවක් නොවේ. බුදුපියාණන් වහන්සේගේ ඒ අධ්‍යාපනක්‍රමය බාල – මහලු, ස්ත්‍රී-පුරුෂ, දිව්‍යබ්‍රහ්ම, මිනුෂ්‍යා දී හැම ලෝවැසියෙකුට ම සාධාරණ වූවකි. ඒ හැම දෙනාට ම පූර්වෝක්ත සියලු දුක් නැති කිරීමට උපකාර වන සේ මනාව සකස් කරනලද්දකි.

"බුද්දහමට අනුව මෙලොව දියුණුවක් නොලැබිය හැකිය"යි, ඇතැම්හු සිතති, කියති, ලියති. එයට එක ම හේතුව ත්‍රිපිටකය හෙවත් බුද්දහම පිළිබඳ හරි දැනුමක් නිසි අවබෝධයක් නැතිකමයි. සත්වයාගේ ඓහලෞකික පාරලෞකික හැම යහපත කට ම මහ පෙන්වන, ඉවහල් වන ශ්‍රේෂ්ඨතම ඉගැන්වීම් ක්‍රම සහශ්‍රසඞ්ඛ්‍යාවෙන් ඒ ධර්මයෙහි ගැබ් වී තිබෙනබව ඔවුහු නොදනිති.

බුදුපියාණන් වහන්සේ ජීවමාන කාලයෙහි මිනිසාගේ මෙලොව දියුණුව සඳහා ඉදිරිපත් කළ ඇතැම් ඉගැන්වීම්ක්‍රම පිළිබඳ යථාවබෝධයක් ලත් අනන්ත - අප්‍රමාණ කුල (පවුල්) හා කුලපුත්‍රයෝ ගම් - නියම් ගම් - රාජධානීන් ද සමහ ලෞකික දියුණුවෙන් ද අගතැන් පත් වූ බවට සාක්ෂ්‍යයෝ අපමණයහ. අද ද පවා කිතුගොස පැතිරෙන විශාලාමහනුවර එසේ දියුණු වූ නගර අතුරෙන් එකකි. වර්තමාන යුරෝපියයන් පවා ගෞරව සම්ප්‍රයුක්ත ඇසින් බැලුම් හෙලන අශෝක ධර්මරාජ්‍යය සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු ධර්මවිජයයෙන් දියුණුවෙන් දියුණුවට පත් අධිරාජ්‍යයෙකි. අතීත ශ්‍රී ලඞ්කාව ද එසේ දියුණු වූ රාජ්‍යයන්ගෙන් එකෙකි.

මාගේ බුදුපියාණන් වහන්සේ උගන්වා වදළ:

> උට්ඨානසම්පද,
> ආරක්ඛසම්පද,
> කල්‍යාණමිත්තතා,
> සමජීවිකතා

යන වචනයන් පිළිබඳ අර්ථයේ පතුළට ම නුවණින් බැස ගත් ඒ ඒ රජදරුවෝ ස්වකීය රාජ්‍යයන් සිය කුටුම්බයන් (පවුල හෝ බුදලය) ලෙස සැලකූහ. "මේ රාජ්‍යය මවිසින් ම දියුණු කරගතයුතුය"යි, සිතූහ. එහෙයින් ඔවුන්ගේ සන්තානයන්හි හට ගත් "මෙය මගේමරට – මගේ ම රාජ්‍යය

මගේ ම ආගම'' යන ප්‍රෞඪ හැඟීම් ඇට මිදුලු දක්වා කාවැදී ගියහ. ඒ වේගවත් හැඟීම් විසින් ඉදිරියෙන් ඉදිරියට ම මෙහෙය වනුලැබූ: දේවානම්පියතිස්ස දුට්ඨගාමිණී සද්ධාතිස්ස-මහාසෙන – කුමාරදාස – මහා-විජයබාහු - මහාපරාක්‍රමබාහු ආදී වූ අපේ සිංහල නරශ්‍රේෂ්ඨයෝ ද, ස්වකීය රට වැසියාටත් පූර්වෝක්ත ඒ අත්‍යුදර හැඟුම් උණු උණුවේ පොවා ස්වරාජ්‍යය ස්වයං පෝෂිත කළාහ. ශ්‍රීලංකාව ''ඉන්දියන් සාගරයේ මුතුඇටය බවට'' පත්කළහ. ''පෙරදිග ධාන්‍යාගාරය'' යි, තුඩ තුඩ රැව් පිළිරැව් නැංවූහ. අහසින් වැටුණු එක් දියබින්දුවකුදු ලක්වැසියාගේ ප්‍රයෝජනයට නොගෙන මුහුදුබත් වන්නට ඉඩ නො-දුන්හ. ''ලුහුණු පොත්තක් තරම් වූ ඉතා කුඩා ද්‍රව්‍යයකුදු, තප්පරයක් තරම් වූ ඉතා කුඩා කාලයකුදු අපතේ යන්නට'' ඉඩ නොතැබූහ. ''පසළොස්වැනිවූ හෝ සොළොස් වැනි වයස්හී පිහිටි, සර්වාඞ්ග ශෝභන, සුරූපී, තරුණ කාන්තාවකට වුවත්; මහඟු මිණිරුවනක් අත්ලෙහි තබා ගෙන, තුන් සිංහලය මුළුල්ලෙහි හුදකලාව ම සිත්සේ ඇවිද, කිසිවකුගෙන් කිසි ගැහැටක් නොලබා, යළිත් සිය නිවස කරා නිරුපද්‍රැත ව ම පැමිණිය හැකි වනසේ ''මුළු ලඞ්කාද්වීපය ම අර්ථානුගත වූ ම ධර්මද්වීපයක් බවට'' පත් කළහ. ත්‍රිපිටක චූළාභය-මහාසුම්ම - ගෝදත්තතිස්ස - සංඝපාල-දිඹුලාගල කස්සප- පොළොන්නරු ශ්‍රී ශාරීපුත්‍රාදී මාහිමිවරුන් වැනි පැවිදි මහපඬිවරුන් ද, සක්දමල – අසක්දමල - ගුරුළුගෝමී - සඳගෝමී–දඹදෙණි පරාක්‍රමබාහු වැනි ගෘහස්ථ මහ පඬිවරුන් ද ඇති කළහ. ''ඉස්සර ලංකාවේ හාල්කුල්ල තුට්ටුවට දුන්නා'' යනාදී විරුදවලි අද ද පවා තුඩ තුඩ කියවෙන ලෙසට සැබැවින් ම ශ්‍රීලංකාව ස්වයංපෝෂිත කළහ. මෙය නම් මාගේ ඒ තිලෝගුරු බුදුරජාණන් වහන්සේගේ ඒ අත්‍යුදර මහඟු අධ්‍යාපනක්‍රමයේ අනුහසක් ම ය.

එහෙයින් අදත් ශ්‍රීලංකාවට අවශ්‍ය යෙන් ඕනෑකරන්නේ ආර්ථික අංශයෙන් පමණක් දියුණු වීමට මඟ පෙන්වන අධ්‍යාපනක්‍රමයක් නොව කිහිප විටක් ම ඉහත සඳහන් කළ. ආර්ථිකාදී චතුර්විධ අංගයන්ගෙන් ම අතිශයින් ම උසස් ලෙස දියුණු විය හැකි, සම්මාසම්බුදුපියාණන් වහන්සේගේ ඒ පරමෝදර අධ්‍යාපන ක්‍රමය බව දැඩුරාම පැවැසිය හැකි ය.

---

1. (අ) අධ්‍යයනං (අධි-ඉඞ-භාවෙ ල්‍යුට්) ගුරු මුඛාදනුපූර්වො ශ්‍රවණං, පඨනං (ශබ්දල්පද්‍රුම) (ආ) අධි-ඉඞ-ල්‍යුට්. පඨනෙ, ගුරුමුඛොච්චා-කරණෙ ච. (වාචස්පති)
2. (i) අධ්‍යාපනං, (අධි-ඉඞ-ණිච්-භාවෙ ල්‍යුට්) පාඨනං, විද්‍යාදනං. (ශබ්දකල්පද්‍රුම)
   (ii) අධි-ඉඞ-ණිච්=භාවෙ ල්‍යුට්. පාඨනායාම් (වාචස්පති)
   (iii) ඉංග්‍රීසි ශබ්දකෝෂ.
4. ජෝන් ඩිවි.
5. හර්බට් ස්පෙන්සර්.
6. ජෝන් ඩිවි.
7. මහාත්මා ගාන්ධි.
8. ශ්‍රී ලංකාවේ නූතන අධ්‍යාපනක්‍රම සම්පාදකයෝ
9. අංගුත්තර නිකාය: 8. නිපාතය. 4. සූත්‍රය. දීඝනිකාය පාථීයවග්ග 8. සූත්‍රය.
10. බ්‍රහ්මජාල සූත්තට්ඨකථා.
11. අඞ්ගුත්තර 8 වැනි නිපාතය: 2 වග්ගය, සූත්‍රය
12. සාලෙය්‍යකාදී අනේක සූත්‍ර
13. කකචූපම, රාජෝවාදදී සූත්‍ර,
14. වම්මීකාදී සූත්‍ර,
15 ධනියගෝපාදී සූත්‍ර,
16. සිරිමා ආලවකාදී සූත්‍ර කථාව,
17. සංයුක්තනිකායේ ජාගරාදී සූත්‍ර,
19. සං. නි. 706 පිට ඇම්, ඇම්, සි. වි. මුද්‍රණ'
20. රට්ඨපාල, දේවෝරෝහණාදී කථා.
21. බාහියදරුචීරිය, අඞ්ගුලිමාලාදී සූත්‍ර,
22. ආලවකාදී සූත්‍ර, චූල්ලපන්ථකාදී කථා
23. ම. නි. මහාගෝසිංග සූත්‍රය, (ජ. මු,) හා එම අටුවාව
24. ම. නි. උපරිම පණ්ණාසකය 4 වර්ගය මුළුමනින්ම.
25. සං. නි. ජ. මු. 2 කාණ්ඩය 40 පි.